# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1715/31 – 2011 ජූලි 22 වැනි සිකුරාදා – 2011.07.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: එල්ඩී/05/2001/එච්ඩබ්/243.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: එච්අයිකේ/ඩීඑස්/එල්එන්ඩී/අයිඑන්වී/05.

කොළඹ, ගාල්ල, හම්බන්තොට මාර්ගයේ සීනිගම පාලම නැවත ඉදිකිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 63, වැරැල්ලාන නම් ගමේ පිහිටි මු.පි.ගා. 3866 පිඹුරේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0396ක් වූ පහත සඳහන් ඉඩම් කැබලිවලට මායිම්.

කැබලි අංකය 01
ඉඩමේ නම: ආරච්චිගෙවත්ත; ප්‍රමාණය: හෙක්. 0.0025.

කැබලි අංකය 02
ඉඩමේ නම: ආරච්චිගෙවත්ත; ප්‍රමාණය: හෙක්. 0.0040.

කැබලි අංකය 03
ඉඩමේ නම: වෙලේගෙවත්ත; ප්‍රමාණය: හෙක්. 0.0012.

කැබලි අංකය 04
ඉඩමේ නම: වෙලේගෙවත්ත; ප්‍රමාණය: හෙක්. 0.0016.

කැබලි අංකය 05
ඉඩමේ නම: වෙලේගෙවත්ත; ප්‍රමාණය: හෙක්. 0.0017.

කැබලි අංකය 06
ඉඩමේ නම: කළුගුරුගේවත්ත; ප්‍රමාණය: හෙක්. 0.0286.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 සැප්තැම්බර් මස 14 වැනි දින පූ. භා. 10.00 ට හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2011 ඔක්තෝබර් මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

යූ. ජී. විදුර කාරියවසම්,
ප්‍රාදේශීය ලේකම්,
හික්කඩුව.

2011 ජූනි මස 24 වැනි දින,
හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 212

## සංශෝධනයයි

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: බිය3/1/1/237(2).

වර්ෂ 2008 මැයි මස 12 වැනි දින අංක 1549/1 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ සඳහන් මු.පි.ගම්. 3437 දරන පිඹුරේ කැබලි අංක 25, 26, 27, 28, කැබලි අංක 68, 69, 70 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

**කැබලි අංක 68**

ඉඩමේ නම: වරි. අංකය සොයාගත නොහැක, නුවර පාර; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එම්. මානෙල් චන්ද්‍රකාන්ති ද සිල්වා, නො. 138, නුවර පාර, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0074.

**කැබලි අංක 69**

ඉඩමේ නම: වරි. අංකය සොයාගත නොහැක, නුවර පාර; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එම්. මානෙල් චන්ද්‍රකාන්ති ද සිල්වා, නො. 138, නුවර පාර, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0099.

**කැබලි අංක 70**

ඉඩමේ නම: වරි. අංකය සොයාගත නොහැක, නුවර පාර; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එම්. මානෙල් චන්ද්‍රකාන්ති ද සිල්වා, නො. 138, නුවර පාර, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0028.

ඉහත සඳහන් ඉඩමට පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් පහත සඳහන් දිනයේ දී පහත සඳහන් වේලාවට බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

| දිනය | කැබලි අංක | වේලාව |
|---|---|---|
| 2011.08.05 | 68 සිට 70 | පෙ.ව. 10.00 |

තවද, 2011 අගෝස්තු මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ටී. ඩී. එස්. පී. පෙරේරා,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
බියගම.

2011 ජූලි මස 04 වැනි දින,<br>
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය,

08 - 213